**2025-01-06 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර රේගු කටයුතු සම්බන්ධිත සහයෝගිතාව හා අන්‍යෝන්‍ය සහාය ලබාගැනීම පිළිබඳ ගිවිසුම**

ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර රේගු කටයුතු සම්බන්ධිත සහයෝගිතාව හා අන්‍යෝන්‍ය සහාය ලබාගැනීම පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීම පිණිස 2021-11-23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති නමුත් අදාළ ගිවිසුමට මෙතෙක් අත්සන් තබා නොමැත. යෝජිත ගිවිසුම මගින් දෙරට අතර වෙළෙඳ ගනුදෙනුවල පිරිවැය අඩු කිරීම, දේශසීමා මායිම් ආශ්‍රිත බදු නිරවද්‍ය ආකාරයෙන් ගණනය කිරීම හා එක්රැස් කිරීම, සීමාකිරීම්වලට යටත් භාණ්ඩ හුවමාරු වීම තහනම් කිරීම, සීමාකිරීම සහ පාලනය කිරීම සම්බන්ධිත රෙගුලාසි පැනවීම යන අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ. දෙපාර්ශ්වය විසින් එකඟ වී ඇති ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර එකී ගිවිසුම අත්සන් තැබීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. මෙරට ජාත්‍යන්තර ගුවන්තොටුපොළවල් ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් ප්‍රදානය කිරීම**

යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (රත්මලාන) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා ජාත්‍යන්තර ගුවන් සේවා ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් සීමාසහිත ගුවන්තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා දිරිගැන්වීමේ සහන යෝජනා ක්‍රම හඳුන්වා දී තිබේ. ඒ යටතේ, එම ගුවන්තොටුපොළවල් සඳහා අපගමන බද්දට අදාළව සලසා ඇති සහන තවදුරටත් පහත සඳහන් පරිදි දීර්ඝ කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியு, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

* යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දෙන් 50%ක ගාස්තු අත්හැරීමේ සහනය 2026-01-30 දින දක්වා දීර්ඝ කිරීම.

* කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (රත්මලාන) වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දෙන් 50%ක ගාස්තු අත්හැරීමේ සහනය 2025-03-27 දින සිට වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම.

* මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දට අදාළ පූර්ණ සහනය 2024-12-29 දින සිට තවත් වර්ෂයක කාලයක් දක්වා දීර්ඝ කිරීම.

03. **රජයේ ආයතනවල ඉවතලන කඩදාසි සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාලච්චේන කඩදාසි කම්හල වෙත භාර දීම**

වාලච්චේන කඩදාසි කම්හලේ නිෂ්පාදන කටයුතු 2020 වර්ෂයේ දී නැවත ආරම්භ කර ඇති අතර, නිෂ්පාදන කටයුතු සඳහා දැනට යොදා ගැනෙන ප්‍රධානතම අමුද්‍රව්‍ය ඉවතලන කඩදාසි වේ. එකී නිෂ්පාදන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා ඉවතලන කඩදාසි තොග අඛණ්ඩව සපයා ගැනීම අත්‍යාවශ්‍ය වී ඇත. රජයේ ආයතනවල පවතින ඉවතලන කඩදාසි, වාලච්චේන කඩදාසි කම්හලට ලබා දීම තුළින්, ප්‍රමාණවත් හා අඛණ්ඩ අමුද්‍රව්‍ය සැපයුමක් ලැබීම තහවුරු කර ගත හැකි බව නිරීක්ෂණය කර තිබේ. ඒ අනුව, වාලච්චේන කඩදාසි කම්හලට අඛණ්ඩ කඩදාසි සැපයුමක් තහවුරු කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ පහත සඳහන් යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* රජයේ මුද්‍රණාලය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, මැතිවරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන රජයේ ආයතන, සියලුම විශ්වවිද්‍යාල, රජයේ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙතින් බැහැර කරනු ලබන තත්ත්වයෙන් උසස් සුදු කඩදාසි ඇතුළු ඉවතලන කඩදාසි තොග, සීමාසහිත ජාතික කඩදාසි සමාගම විසින් ප්‍රවාහන පහසුකම් සැපයීමේ පදනම මත නොමිලේ සීමාසහිත ජාතික කඩදාසි සමාගම වෙත භාර දීම.

* අනෙකුත් රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන සහ රජයට අනුබද්ධිත සියලුම ආයතනවල පවතින ඉවතලන කඩදාසි තොග, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව අදාළ ආයතන හා සීමාසහිත ජාතික කඩදාසි සමාගම එකඟවන සාධාරණ මිලකට එකී සමාගම වෙත භාර දීම.

04. **නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේදී අක්ෂි ශල්‍යකර්මවලට භාජනය වූ රෝගීන් කිහිපදෙනෙකුගේ දෘෂ්ටිය අහිමි වීමට අදාළ වන්දි ගෙවීම**

නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේදී අක්ෂි ශල්‍යකර්මවලට භාජනය වූ රෝගීන් කිහිපදෙනෙකුගේ දෘෂ්ටිය අහිමි වීම පිළිබඳව වින්දිතයන්ට ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීම පිණිස තාක්ෂණික කමිටුවක් පත් කිරීමට 2024-02-12 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇති අතර, එකී කමිටුව විසින් අදාළ කරුණු අධ්‍යයනය කර ගෙවිය යුතු වන්දි මුදල් පිළිබඳව සිය නිර්දේශ ඉදිරිපත් කර තිබේ. එකී නිර්දේශ මත පදනම්ව අදාළ සිදුවීම හේතුවෙන් බලපෑමට ලක් වී ඇති රෝගීන් 17 දෙනෙකු සඳහා පහත සඳහන් පරිදි වන්දි මුදල් ගෙවීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* රෝගීන් 12 දෙනෙකු සඳහා රුපියල් 1,000,000/- බැගින් වන්දි ගෙවීම.

* රෝගීන් 02 දෙනෙකු සඳහා රුපියල් 750,000/- බැගින් වන්දි ගෙවීම.

* එක් රෝගියෙකු සඳහා රුපියල් 700,000/-ක වන්දියක් ගෙවීම.

* රෝගීන් 02 දෙනෙකු සඳහා රුපියල් 250,000/- බැගින් වන්දි ගෙවීම.

05. **කොළඹ වරායේ මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට වරාය වග් යාත්‍රා දෙකක් කුලියට ගැනීම**

2022-10-10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා 80 Ton Bollard Pull Tug යාත්‍රා 01ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 04ක් ලැබී තිබූ අතර

ප්‍රතිචාරාත්මක ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අතරතුර 2024-01-01 දින සිට එකතු කළ අගය මත පනවන ලද බදු පනත ක්‍රියාත්මක වීම හේතුවෙන් අදාළ ප්‍රසම්පාදන පිරිවැයට බදු වටිනාකම එකතු කිරීම මත ප්‍රසම්පාදන පිරිවැය ඉහළ යාම නිසා එකී ටග් යාත්‍රාව ණය පදනම මත ලබා ගැනීම පිණිස නිර්දේශිත සැපයුම්කරු සමඟ සාකච්ඡා කර ඇති නමුත් ඒ සඳහා සැපයුම්කරු එකඟ නොවීම මත එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර තිබේ. ඉන් අනතුරුව, 80 Ton Bollard Pull Tug යාත්‍රා 02ක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 03ක් ලැබී ඇත. අදාළ ප්‍රසම්පාදනය වෙනුවෙන් සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වෙතින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වාසිදායක වන පරිදි මිල අඩු කිරීමක් ලබා ගැනීම පිණිස ලංසුකරු සමඟ සාකච්ඡා කර ඇති නමුත් සැලකිය යුතු මිල අඩු කිරීමක් ලබා දීමට එකඟතාව පළ කර නොමැත. ඒ අතරතුර කොළඹ වරායේ නව පර්යන්තයන්හි ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රගතිය මත ටග් යාත්‍රාවල අවශ්‍යතාව නැවත තක්සේරු කළ යුතු බැවින් ඉහත සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවලංගු කරන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරිත්වය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. නව පර්යන්ත ඉදිකිරීම 2025 වසරේ මැද භාගයේ සිට අවසන් භාගය අතර කාලය තුළදී නිම කිරීමට නියමිත බව සැලකිල්ලට ගෙන පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ වරායේ සිදු කරනු ලබන මෙහෙයුම් සඳහා 80 Ton Bollard Pull Tug යාත්‍රා 02ක් කුලී පදනම මත ලබා ගැනීම පිණිස ක්‍රියාත්මක කරනු ලැබ ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීම.

* 2025 වසර මැද භාගය තුළ ආරම්භ කිරීමට නියමිත නව පර්යන්ත මෙහෙයුම් සඳහා අවශ්‍ය 70 Ton Bollard Pull Twin Azimuth Stern Drive Harbour Tug යාත්‍රා 02ක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා නව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම.

## 06. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ "රිච්මන්ඩ් කාසල්" අලුත්වැඩියා කොට සංරක්ෂණය කිරීම

කළුතර දිස්ත්‍රික්කයේ පලාතොට පිහිටි "රිච්මන්ඩ් කාසල්" පරිශ්‍රය හා පාර්ක් වත්ත මහා භාරකාර දෙපාර්තමේන්තුව සතු බූදලයක් වන අතර, එය දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක්ව ඇති ඓතිහාසික මෙන්ම

පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් පරිශ්‍රයක් වේ. මොරටුව විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අංශය සහ ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් එම මන්දිරයේ සිදු කළ යුතුව ඇති අත්‍යවශ්‍ය අලුත්වැඩියා රාශියක් පෙන්වා දී තිබේ. ඒ අනුව, තෙස්තමේන්තුකරුගේ අභිප්‍රායන්ට පටහැනි නොවන පරිදි "රිච්මන්ඩ් කාසල්" මන්දිරය අලුත්වැඩියා කිරීම සහ එකී මන්දිරයෙහි කටයුතු පවත්වාගෙන යාම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සිදු කිරීමට හැකි වන පරිදි උනන්දුවක් දක්වන පෞද්ගලික අංශයේ ආයෝජකයින් වෙතින් යෝජනා කැඳවීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. නව අනුරාධපුර - නව හබරණ කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය ඉදිකිරීම

විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ 4A පැකේජය යටතේ කිලෝමීටර 45ක් වූ නව අනුරාධපුර - නව හබරණ කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය ඉදිකිරීම සඳහා වූ සිවිල් ඉදිකිරීම් කටයුතු, කුලුනු ඉදිකිරීම් සහ රැහැන් එලීමේ කටයුතු සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම පිණිස ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 02ක් ඉදිරිපත් වී තිබේ. ඒ අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Ceylex Engineering (Pvt.) Ltd. වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහා සංශෝධන

විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටින ලෙස නියම කිරීම ඉවත් කිරීම සඳහාත්, දූරස්ථ සාක්ෂි පටිගත කිරීම සහ විශේෂඥ සාක්ෂිකරුවන් වෙත විද්‍යුත් තැපැල මඟින් සිතාසි ලබා දීම සඳහා විධිවිධාන සැලසීම පිණිසත් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා 2023-12-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරනු ලැබ ඇති අදාළ පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම**

ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති ලෙස කටයුතු කළ චාමින්ද හෙට්ටිආරච්චි මහතා 2025-01-01 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම හේතුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුර පුරප්පාඩු වී පවතී. එම තනතුර සඳහා දැනට ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ඩබ්ලිව්.ජී.එම්.හේමන්ත කුමාර මහතා පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස් සහ සහකාර කොමසාරිස්වරුන් පත් කිරීම**

1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 4(1) වගන්තිය අනුව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කොමසාරිස්වරයෙකුගෙන් සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වේ. මේ වනවිට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සියලුම සාමාජිකයින් ඉල්ලා අස් වී ඇති අතර, පුරප්පාඩු සඳහා කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකු පත් කළ යුතුව ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්වරයා ලෙස මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා පත් කිරීමටත්, එම කොමිසමේ සහකාර කොමසාරිස්වරුන් ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.එම්.ජී.රාජපක්ෂ මහතා සහ වෛද්‍ය එන්.ආර්.එස්. ආරියරත්න මහතා පත් කිරීමටත් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා පත් කිරීම**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කළ යුතුව ඇති අතර, ඒ සඳහා රුහුණ

විශ්වවිද්‍යාලයේ සාගර විද්‍යා හා සමුද්‍ර භූ විද්‍යා අධ්‍යයන පීඨයේ සාගර විද්‍යාව පිළිබඳ මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා සුදුසු බවට හඳුනා ගෙන තිබේ. ඒ අනුව, ඒ මහතා වසර දෙකක (02) කාලයක් සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ශ්‍රී ලංකා රජය "එක් චීනයක් ප්‍රතිපත්තිය" අඛණ්ඩව අනුගමනය කිරීම**

ශ්‍රී ලංකා රජය "එක් චීනයක් ප්‍රතිපත්තිය" අඛණ්ඩව අනුගමනය කර ඇති අතර, එමඟින් නීත්‍යානුකූල චීනය ලෙස මහජන චීන සමූහාණ්ඩුව පමණක් පිළිගන්නා බවත්, තායිවානය චීනයේ එක් පළාතක් ලෙස පමණක් පිළිගන්නා බවත් අදහස් කරනු ලබයි. ශ්‍රී ලංකා රජයේ එකී ප්‍රතිපත්තිය ඒ අයුරින්ම තවදුරටත් අනුගමනය කරමින් ඊට අනුගතව කටයුතු කරනු ලබන බවට විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

13. **චීන මාධ්‍ය සමූහය (China Media Group) සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම**

දෙපාර්ශ්වය අතර ඇති කර ගනු ලබන සහයෝගිතාව මත චීන මාධ්‍ය සමූහයේ අති නවීන තාක්ෂණය සහ විශේෂඥ දැනුම උපයෝගි කරගනිමින් ශ්‍රී ලංකාව චීන සංචාරකයින් සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීමේ අරමුණින් චීන මාධ්‍ය සමූහය (China Media Group) සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීමට යෝජනා වී ඇත. ඒ අනුව, එකී අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **චීන වෙළෙඳපොළට කුකුල් මස් අපනයනය සම්බන්ධ ක්‍රියාපටිපාටිය (Protocol) සඳහා අදාළ වන ගිවිසුම අත්සන් කිරීම**

චීන රේගු පාලන ආයතනයේ මැදිහත් වීමෙන් ශ්‍රී ලංකාවෙන් කුකුල් මස් චීනයට අපනයනය කිරීම නිශ්චිත ක්‍රියාපටිපාටියක් අනුව සිදු කිරීම සඳහා දෙරට අතර අදාළ ක්‍රියාපටිපාටිය සම්බන්ධව පරීක්ෂා කිරීම, නිරෝධායනය හා

සෞඛ්‍ය අවශ්‍යතා ඇතුළත්ව සකස් කරනු ලබන ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව, එකී ගිවිසුම චීන රේගු පාලන ආයතනය සහ සිය අමාත්‍යාංශය අතර අත්සන් තැබීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ශ්‍රී ලංකාවට හදිසි මානුෂීය ආධාර සැපයීම පිළිබඳ ව්‍යාපෘතියට (සහල්, ධීවර දැල් හා පෙර සකසන ලද නිවාස) අදාළව ශ්‍රී ලංකාව සහ චීනය අතර භාර දීමේ සහතිකය අත්සන් කිරීම**

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණ ධීවරයින් සඳහා යුවාන් මිලියන 35.7ක වියදමින් මහජන චීන සමූහාණ්ඩුව විසින් පහත සඳහන් හදිසි ආධාර සපයනු ලැබ තිබේ:

* කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා ධීවර දැල් 75,000ක්.
* කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා පෙර සකසන ලද නිවාස 500ක්.
* කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා සහල් ටොන් 1,630ක්.

මෙම සියලු භාණ්ඩ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය විසින් 2024 වර්ෂයේ දී භාරගත් අතර, සහල් සහ ධීවර දැල් මේ වන විට තෝරාගත් ප්‍රතිලාභීන් අතර බෙදා දී ඇත. ඒ අනුව, එකී හදිසි ආධාර භාර දීමේ සහතිකය මහජන චීන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් තැබීම පිණිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

16. **සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ ආයතන අතර අවබෝධතා ගිවිසුම්වලට/සහයෝගිතා ගිවිසුමට අත්සන් තැබීම**

දෙරට අතර පවතින සහයෝගිතාව ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ පහත සඳහන් ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

(i) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ ජාතික ගුවන්විදුලි සහ රූපවාහිනී පරිපාලනය අතර අවබෝධතා ගිවිසුම.

(ii) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ චීනයේ ෂින්හුවා පුවත් නියෝජිතායතනය (Xinhua News Agency) අතර අවබෝධතා ගිවිසුම.

(iii) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ චීනයේ ෂින්හුවා පුවත් නියෝජිතායතනය (Xinhua News Agency) අතර සහයෝගිතා ගිවිසුම.

(iv) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ චීන මාධ්‍ය සමූහය (China Media Group) අතර අවබෝධතා ගිවිසුම.

(v) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ චීන මාධ්‍ය සමූහය (China Media Group) අතර අවබෝධතා ගිවිසුම.

**17. පාසල් ළමුන්ට ලිපිද්‍රව්‍ය ලබා දීමේ වැඩසටහන යටතේ අස්වැසුම නොලබන අනෙකුත් සුදුසුකම් ලබන පවුල්වල ළමුන් සඳහා දීමනාව ලබා දීම**

අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල පාසල් ළමුන් සඳහා ලිපිද්‍රව්‍ය ලබා ගැනීම පිණිස රුපියල් 6,000/-ක් බැගින් වන දීමනාව මේ වන විටත් එම පවුල්වල බැංකු ගිණුම් හරහා ලබා දීමට පියවර ගනු ලැබ ඇත. අස්වැසුම ප්‍රතිලාභී පවුල්වලට අයත් නොවන දෙමාපියන් අහිමි ළමුන්, මව හෝ පියා ආබාධිත පවුල්වල ළමුන්, ළමා නිවාසගත පාසල් වයසේ සිටින සියලුම ළමුන් සහ විශේෂ හේතු මත අසරණභාවයට පත්ව ඇති කාණ්ඩවලට අයත් ළමුන් සඳහා එම දීමනාව ලබා දීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරනු ලැබ ඇත. එම කාණ්ඩයන්ට අයත් පවුල්වල ළමුන් තෝරා ගැනීම සඳහා යාවත්කාලීන දත්ත පද්ධතියක් දැනට නොමැති වීම සහ යෝජිත ලිපිද්‍රව්‍ය 2025 නව පාසල් වාරය ආරම්භයේදීම ලබා දීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් දිවයින පුරා පිහිටි මුළු පාසල් 10,096 අතුරින් ළමුන් සංඛ්‍යාව 300ට අඩු පාසල් 6,576ක අස්වැසුම ප්‍රතිලාභී නොවන පවුල්වල සියලුම ළමුන්ට, ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිට පාසල් වෙත පැමිණෙන ළමුන්ට සහ පිරිවෙන්වල ඉගෙනුම ලබන ගිහි පැවිදි සිසුන්ට රුපියල් 6,000/-ක් බැගින් වූ ලිපිද්‍රව්‍ය දීමනාව ලබා දීමටත්, එකී දීමනාව වවුචර් පත්‍රයක් මඟින් ලබා දීමටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

************